රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල. Richmond College,

දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය 2018

Second Term Test – Grade 7, 2018

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | I II | පැය දෙකයි |
| புவியியல் | I II | இரண்டு மணித்தியாலம் |
| Geography | I II | *Two hours* |

## I කොටස

සැලකිය යුතුයි.

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.
-

01. ඉන්දියන් සාගරයේ පිහිටා ඇති දූපතක් වන්නේ,

I. නවසීලන්තය II. කියුබාව

III. ජපන් දූපත් ය. IV. අන්දමන් දූපත් ය.

02. පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වනුයේ,

I. වර්ග කිලෝමීටර් මිලියන 510 කි. II. වර්ග කිලෝමීටර් මිලියන 610 කි.

III. වර්ග කිලෝමීටර් මිලියන 365 කි. IV. වර්ග කිලෝමීටර් මිලියන 432 කි.

03. දකුණු ආසියානු රටවල් අතුරින් ඉහළ ම සාක්ෂරතාව තිබෙන රට වන්නේ,

I. ඉන්දියාව යි. II. පාකිස්ථානය යි.

III. මාලදිවයිනයි. IV. ශ්‍රී ලංකාව යි.

04. ස්පෘශ්‍ය උරුමයකට උදාහරණයක් නොවන්නේ,

I. සිංහරාජය යි. II. ආගන්තුක සත්කාරයයි.

III. දළදා මාළිගාවයි. IV. නල්ලූර් කෝවිල යි.

05. ආදි වාසී ජනතාව ජීවත්වන මහවැලි ගොවිජනපදයක් වන්නේ,

I. යාල II. දඹුල්ල

III. ගිරාඳුරු කෝට්ටේ IV. හෙන්නානිගල

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.**

06. ලොව විශාලත්වයෙන් වැඩි ම ව්‍යාප්තියක් ඇති සාගරය වන්නේ

07. පෘථිවි පෘෂ්ඨයෙන් ..........................................ක් ගොඩබිමෙන් වැසී ඇත. ..........................................

08. ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් කඳු පද්ධති දැකිය හැකි වන්නේ ..........................................භූ දර්ශනය තුළ ය.

09. ස්ප්‍රාශ්‍ය උරුමයක් වන සීගිරිය පිහිටා ඇත්තේ ..........................................තුළ ය.

10. පෘථිවි පෘෂ්ඨයේ ජලයෙන් වැසී ඇති ප්‍රමාණය .......................................... කි.

( ඉන්දියන් සාගරය, 29%, පැසිෆික් සාගරය, මධ්‍ය කඳුකර, 71%, අභ්‍යන්තර තැනිතලාව )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය නිවැරදි නම් ☑ ලකුණ ද වැරදි නම් ☒ ලකුණ ද වරහන් තුළ ලියන්න.**

11. උතුරු අර්ධගෝලයේ අක්ෂාංශ 23.5° කර්කටක නිවර්තනය නමින් හඳුන්වයි. (................)

12. ආඬියා ළිං දක්නට ලැබෙන්නේ යාපන අර්ධද්වීපය ආශ්‍රිත භූ දර්ශනය තුළ ය. (................)

13. දකුණු පළාතට අයත් කොග්ගල නිදහස් වෙළෙඳ කලාපයයි. (................)

14. ස්වාභාවික ආපදාවක් වන නායයෑම් බහුල ව සිදුවන්නේ අතරමැදි කලාපය තුළයි. (................)

15. රත්මලාන හා ඒකළ කාර්මික ජනපද නොවේ. (................)

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න**

| | A | B |
|---|---|---|
| 16. | උතුරු මැද පළාතේ ප්‍රධාන නගරය | සංවහන |
| 17. | ලෝක උරුමයක් වන සීගිරිය පිහිටි දිස්ත්‍රික්කය | මෝසම් |
| 18. | ශ්‍රී ලංකාවේ නිරිත හා ඊසාන දෙසින් රට තුළට ඇතුළු වන කාලීන සුළං | හම්බන්තොට |
| 19. | වර්ෂය මුළුල්ලේ ම ක්‍රියාත්මක වන වැසි ක්‍රමයකි. | අනුරාධපුරය |
| 20. | කටු පඳුරු සහිත ශාක වැවෙන දිස්ත්‍රික්කයකි. | මාතලේ |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

සැලකිය යුතුයි.

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 4 කටත් පිළිතුරු සපයන්න.**

01. සපයා ඇති ලෝක ආකෘති සිතියම් පහත දී ඇති ස්ථාන ලකුණු කොට නම් කරන්න.

I. පැසිපික් සාගරය
II. ඕස්ට්‍රේලියා මහද්වීපය
II. ග්‍රිනිච් මධ්‍යහ්න රේඛාව
IV. රතු මුහුද
V. සුමාත්‍රා දූපත
VI. බ්‍රසීලය

(ල. 12)

02. I. පහත සඳහන් සිතියමෙහි A,B,C ලෙස දක්වා ඇති කලාප 3 නම් කරන්න. (ල. 03)




II. රාෂ්ට්‍රීය මුහුදු සීමාව තුළ සිදු කෙරෙන මානව කටයුතු 2 ක් නම් කරන්න. (ල.04)

III. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කොට ඉන් එක් කලාපයක දැකිය හැකි භූ විෂමතා ලක්ෂණ 02 ක් ලියා දක්වන්න.

(ල. 05)

03. I. ජාතික උරුම යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා ඒවා බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල.03)

II. ශ්‍රී ලාංකිකයින් සතු ස්පෘශ්‍ය උරුම අතරින් මානව නිර්මිත හා ස්වභාවික නිර්මිත දෙක බැගින් ලියන්න. (ල.04)

III. ශ්‍රී ලාංකික අනන්‍යතාව විදහා දක්වෙන සංස්කෘතික උත්සව තුනක් නම් කොට ඉන් එකක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල.05)

04. I. රටක සමාජ සංවර්ධනය මැනිය හැකි මිනුම් තුනක් නම් කරන්න. (ල.03)

II. දකුණු ආසියාතික රටවල් අතර ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව 92% ක් වැනි ඉහළ අගයක් ගනී. ඒ සඳහා බලපා ඇති සාධක 02 ක් ලියන්න. (ල.04)

III. ශ්‍රී ලංකාවේ ආයු අපේක්ෂාව ඉහළ මට්ටමක පැවැතීමට බලපා ඇති කරුණු 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

05. I ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ දර්ශන තුනක් නම් කරන්න. (ල.03)

II. කඳුකර භූ දර්ශනය තුළ කැපීපෙනෙන භූ ලක්ෂණ 04 ක් නම් කරන්න. (ල.04)

III. ඉහත භූ දර්ශනය තුළ සිදු කෙරෙන මානුෂ ක්‍රියාකාරකම් 2 ක් පැහැදිලි කරන්න. (ල.05)

06. I පහත දක්වා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ A,B,C වලින් දක්වා ඇති ආයෝජන ප්‍රවර්ධන කලාප දෙක සහ කාර්මික ජනපදය නම් කරන්න. (ල.03)




II එම නගර ආශ්‍රිත ව පවතින ගැටළු 2 ක් ලියන්න. (ල.04)

III. එම ගැටළු විසඳීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග 02 ක් දක්වන්න. (ල.05)